මධ්‍යම පළාත් සභාව - 2025

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පළාත් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 29 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූනි 26 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------------- | -------------- |
| (අ) | 2018 මැයි 10 දිනැති අංක 265/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 වගන්තියේ දක්වා ඇති පරිදි රාජ්‍ය අංශයේ මූල්‍ය විශ්ලේෂණය, සැලසුම්කරණය හා කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සපයමින් ගුණාත්මක මූල්‍ය ගිණුම්කරණයක් හා වාර්තාකරණයක් සඳහා වූ රාමුවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් සපයන බවත්, එහි 03 වන වගන්තිය අනුව මෙම ප්‍රමිතීන් මධ්‍යම රජයේ හා පළාත් සභා ආයතන උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමය භාවිතයට ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිරි ගැන්වීම් කර තිබූ නමුත්, එම | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් උපචිත පදනම මත ගිණුම් සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා ආකෘතින් ලබාදුන් පසුව මධ්‍යම පළාත තුළ උපචිත පදනම මත ගිණුම්කරණ හා වාර්තා කරණය සඳහා කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමය භාවිතයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය නිකුත් කර වර්ෂ 08 කට ආසන්න කාලයක් ගත වී තිබුණද මේ දක්වා මධ්‍යම පළාත් සභාවේ සියළුම ආයතන ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | මධ්‍යම පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (මුදල් කළමනාකරණ අංක සීපීසී/සීඑස්/7/7/1-(61) හා 2025 ජනවාරි 08 දිනැති ලිපිය පරිදි වත්කම් ගිණුම්ගත කිරීම පිළිබඳ ඇති මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් වලට අනුකූල නොවන පරිදි, අමාත්‍යාංශයක, ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ හා දෙපාර්තමේන්තු 06 ක් විසින් දේපළ පිරියත යන්ත්‍ර උපකරණ ගොඩනැගිලි හා ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද එකතුව රු.619,575,993 ක වියදමද ප්‍රධාන ලේකම් කාර්යාලය හා දෙපාර්තමේන්තු 08 ක් විසින් වටිනාකම තක්සේරු කර නොතිබූ ඉඩම් කැබලි 128 ක්, ගොඩනැගිලි 146 ක්, නිල නිවාස 17 ක් , වාහන 05 ක් ද , වටිනාකම රු.104,936,000 කට තක්සේරුකර තිබූ රූඩ් 01 යි පර්චස් 22 ක්වූ ඉඩම , රු.6,700,000 ක් වූ වාහනයක්, රු.1,986,943 ක් වූ වෙනත් වත්කම් 03 ක්ද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු 03ක ආයතන 206 ක් පවත්වාගෙන යනු ලබන ඉඩම් හා ආයතන 123 ක පවත්වාගෙන යන ගොඩනැගිලිද, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 15 ක, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 40 ක, පළාත් සභා පාසල් 1455 ක, ගුරුදෙණිය හා හැටන් සීඩා සම්පත් මධ්‍යස්ථානවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් සහ නිල නිවාස 02 ක වටිනාකමද ගිණුම්ගත කර නොතිබුණි. | 2026 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වාර්තා ලද පසු එම වාර්තා සමග සංසන්දනය කර අදාළ ගැලපීම් කටයුතු සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බලමින් සිටින බව. | ආයතනයට අයත් සියළුම වත්කම් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 වර්ෂයේදි රු.8,865,000 ක් වැය කර පළාත් සභා සංකීර්ණයේ සවිකරන ලද කිලෝ වොට් 45 ක ධාරිතාවයකින් යුත් ජාලගත සූර්යබල විදුලි ඒකක පද්ධතියේ වටිනාකම මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර මෙම විදුලි ජනක පද්ධතිය ක්‍රියා විරහිත වීම නිසා 2014 වසරේ සිට 2025 දෙසැම්බර් 31 දිනට සිදුවී ඇති පාඩුව ලෙස ගණනය කර තිබූ රු.8,043,130 ක් මූල්‍ය ප්‍රකාශනය තුළ ගිණුම්ගත කර නොතිබුණි. | 2026 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට එම තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ආයතනයට අයත් සියළුම වත්කම් සහ ගනුදෙනු වලට අදාළ මූල්‍ය ප්‍රතිඵලයන් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මධ්‍යම පළාත් සභාවේ ආදායම් ගිණුමේ, හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයෙහි 2025 දෙසැම්බර් 31 දිනට රු. 13,126,502 ක් වූ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී හිඟ ආදායම් වාර්තා ලබාගැනීමට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආදායම් ගණන්දීමේ නිලධාරීන් හා ආයතන සමඟ සාකච්ඡාකර විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරන බව. | සියළුම හිඟ ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දේපළ පැවරීම මත මුද්දර බදු ආදායම ලෙස රැස්කිරීමේ ගිණුමට බැර වී තිබුණු එකතුව රු. 1,005,213,326 ක් අදාළ පළාත් පාලන ආයතන හඳුනාගෙන ගැළපීම් කළ බවට සාක්ෂිමය තොරතුරු සහ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ දී ආරම්භක ශේෂයට එකතු කිරීම් රු.45,393,630 ක්, අත්පත් කරගැනීම් රු.86,562,708ක් සහ භෞතික වෙනස්වීම් ලෙස රු.5,601,080 ක් ඇතුළත් කර ඇතත්,එම වටිනාකම් සනාථ කිරීමට අදාළ සාක්ෂිමය කරුණු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | නොතාරිස්වරුන් සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත මුද්දර බදු ආදායම රැස්කිරීම් පිළිබඳව දැනුවත් කර ඇත. එකතු කිරිම් හා වෙනස්වීම් අධ්‍යාපන කලාප මට්ටමින් සිදුවී ඇති අතර ඒවා සනාථ කිරීමට අදාළ සාක්ෂි කලාප කාර්යාල වල ඇති බව. | ඉදිරිපත් කරනු ලබන ගිණුම් තොරතුරු වලට අදාළ සාක්ෂි ප්‍රමාණවත්ව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මධ්‍යම පළාත් සභා ආදායම් ගිණුමේ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව රජයේ ඉඩම් පනත යටතේ පැවරුම් ගාස්තු හා බදු කුලී ආදායම් ශීර්ෂයෙහි සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.179,762,150 ක් වුවත් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු. 122,693,096 ක් වීමෙන් රු.57,069,054ක වෙනසක් පැවතුණි. | 2026 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදි මෙම දෝෂයන් මඟ හරවා ගෙන නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කර යොමු කරන ලෙසට සියළු ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරන ලද බව. | නිවැරදි තොරතුරු මත ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | පළාත් පරිපාලන අංශයේ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක අග්‍රිම ලැබීම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක අග්‍රිම පියවීම් හා මාසික ගිණුම් සාරාංශය අනුව පිළිවෙලින් රු.4,102,316 ක සහ රු.4,151,539 ක වෙනසක් පැවතුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්වල ඇතුළත් කර නැවත ඉදිරිපත් කිරීම සඳහා අදාළ ආකෘති පත් ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත යවා ඇති බව. | නිවැරදි තොරතුරු මත ඉදිරියේදි අදාළ ගැලපීම් සිදු කර ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | පළාත් පරිපාලන අංශයේ තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ශේෂයෙහි රු.1,445,711 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (එ) | පළාත් පරිපාලන අංශයේ 2025 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කළ ආදායම, පොදු තැන්පතු ලැබීම් සහ ගෙවීම්, වැන්දඹු අනත්දරු දායක මුදල් ලැබීම් සහ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් මුදල් වැය කිරීම් හි එකතුව රු. 3,057,649,485 ක් වුවත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එහි එකතුව රු. 3,113,233,424 ක් වී තිබීමෙන් රු. 55,583,939 ක වෙනසක් පැවතුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්වල ඇතුළත් කර නැවත ඉදිරිපත් කිරීම සඳහා අදාළ ආකෘති පත් ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත යවා ඇති බව. | නිවැරදි තොරතුරු මත ඉදිරියේදී අදාළ ගැලපීම් සිදු කර ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | පළාත් පරිපාලන අංශයේ 2025 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයේ ආදායමෙන් ආපසු ගෙවීම්, අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය දරන ලද වියදම සහ එකතු කරන ලද ආදායම් හි එකතුව රු.2,467,235,250 ක් වී තිබූ නමුත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.2,471,701,794 ක් වීමෙන් රු.4,466,544 ක වෙනසක් පැවතුණි. | -එම- | -එම- |
| (ඔ) | පළාත් පරිපාලන අංශය 2025 වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භාණ්ඩාගාරයට ප්‍රේෂණ රු.2,057,959,393 ක් දක්වා ඇතත් අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි එය රු.2,056,598,084 ක් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අග්‍රිම පියවීම් රු.1,361,309 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් භාණ්ඩාගාරයට මුදලින් පියවීම අතර වෙනසකට හේතුව ගඟවටකෝරළේ හා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් යොමුකර ඇති තොරතුරු වල වෙනස්කම් බව. | -එම- |
| (ඕ) | පළාත් පරිපාලන අංශය 2025 වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය රු.2,011,348,043 ක් වී තිබූ නමුත් අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව මුදලින් පියවීම් වටිනාකම රු.2,056,598,084 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම පියවීම් රු.45,250,041 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගඟවටකෝරළේ, වලපනේ හා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය හා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව එම වටිනාකම් අතර ඇති වෙනස හේතුවෙන් රු.45,250,041 ක වෙනසක් සිදු ඇති බව. | නිවැරදි තොරතුරු මත ඉදිරියේදී අදාළ ගැලපීම් සිදු කර ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) | ප්‍රධාන ලේකම් කාර්යාලය 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ හදිසි අවස්ථා අරමුදල් ගිණුමේ 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී වටිනාකම රු.726,914 ක් වුවත් පළාත් සභා අවසන් ගිණුමේ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.3,836,827 ක් ලෙස ලැබිය යුතු පොළී | මෙම තොරතුරු භාණ්ඩාගාර පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී හදිසි අවස්ථා අරමුදලේ ආයෝජන වටිනාකම 9-99-3 කේත අංකය යටතේම ඉහත පොළියද ඇතුළත් කිරීම නිසා ආයෝජන වටිනාකම සහ පොළී | -එම- |

| | |
|---|---|
| වටිනාකම රු.3,109,913 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම යන දෙකෙහි එකතුව ලැබිය යුතු පොළී ආදායම ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් වී ඇති බැවින් මෙම දෝෂය සිදු වී ඇති බව. |

**1.2.2. විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිවාස දෙපාර්තමේන්තුව 2005 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලද රු. මිලියන 11.25 කින් හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යොදවන ලද රු.මිලියන 3.75 ක් ලෙස එකතුව රු.මිලියන 15 කින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භ කරන ලද “සහන් පියස” චක්‍රීය අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.4,996,331 ක් හා ණය ශේෂය රු.8,068,490 ක් ලෙස එකතුව රු.13,064,821ක අරමුදලේ ශේෂයක් විය. ඒ අනුව චක්‍රීය අරමුදලේ ශේෂය රු.1,935,179 කින් පහත වැටීම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | ඉදිරියේදී බැංකුවෙන් තොරතුරු ලබා ගෙන ඉදිරිපත් කරන බව. | ඉදිරිපත් කරනු ලබන ගිණුම් තොරතුරු වලට අදාළ සාක්ෂි ප්‍රමාණවත්ව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම , ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.5.1 ශීර්ෂය 542 - මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

**1.5.1.1 දෘෂ්‍ය අක්‍රමිකතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ලේකම් විසින් 2024 දෙසැම්බර් 18 දින නිකුත් කර තිබූ අංක 05/2024 දරන වත්කම් කලමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාව භාරයේ තිබූ විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ටෙන්ඩර් ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම සඳහා පත්කර තිබූ මුල් තක්සේරු කමිටුවේ පැවති ගැටලු විගණනය විසින් පෙන්වා දීම හේතුවෙන් එම වාහන නැවත තක්සේරු කිරීම සඳහා නව තක්සේරු කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් ලබාදී තිබූ නව තක්සේරු කමිටු වාර්තාව අනුව ඉදිරි අපහරණ ක්‍රියාවලියකට යොමුකර තිබූ සුඛෝපභෝගී වාහන 05 ක නව තක්සේරු වටිනාකම මුල් තක්සේරු වටිනාකමට වඩා රු.140,800,000 සිට රු.187,350,000 දක්වා රු.46,550,000 කින් වැඩිවී තිබුණි. ඒ අනුව ටෙන්ඩර් කමිටුව විසින් වාහන සඳහා මුලින් ඉදිරිපත්ව තිබූ ඉහලම ලංසු මිල ගණන් මත අපහරණය කිරීමට ගත් තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කළේ නම් අක්‍රමිකතාවයක් ඇතිවීමට ඉඩ තිබුණි. | විගණන විමසුම මගින් දක්වන ලද කරුණු පිළිබඳ අවධානය යොමු කර නව තක්සේරු කමිටුවක් මගින් ලබා ගත් තක්සේරු මිල ගණන් මුල් තක්සේරු මිල ගණන් වලට වඩා ඉහළ වටිනාකමක් වූ හෙයින් එම වාහන ඉදිරි අපහරණයට යොමු කර ඇති බව. | තක්සේරු කමිටු පත් කිරීමේදී තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් පත් කළ යුතු අතර මුල් තක්සේරු කමිටුවේ හා ලංසු ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව මෙම වාහන අපහරණය කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අක්‍රමිකතාවයක් ඇති වීමට ඉඩ තිබීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට අදාළව කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර පරිහරණය සඳහා ලබාදී ප්‍රාඩෝ රථය 41,600,000 ක මුදලකට තක්සේරු කර අපහරණය කිරීමට තීරණය කර තිබුණද මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරගේ සම්බන්ධීකරණ ලේකම් විසින් මෙම වාහනය නිල රථය ලෙස භාවිතා කිරීමට ඉල්ලීම හේතුවෙන් මධ්‍යම පළාත් ප්‍රධන ලේකම්ගේ අංක CPC/CS/01/11/09/06 හා 2026 පෙබරවාරි 23 දිනැති ලිපිය මගින් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගෙන් උපදෙස් ඉල්ලා තිබුණ ද ඒ සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබිය දී මෙම වාහනය අපහරණ ක්‍රියාවලියෙන් ඉවත්කර තිබුණි. ඒ හේතුවෙන් මෙම වාහනයේ නව තක්සේරු වටිනාකම අනුව අපහරණය කිරීමෙන් රජයට ලබාගත හැකිව තිබූ රු. 41,600,000 ක මුදලක් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | ප්‍රාඩෝ රථය රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශය වෙත පවරා දෙන ලෙස ද එම අමාත්‍යාංශ ලේකම් දන්වා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බැවින් ඉදිරි අපහරණ ක්‍රියාවලියට මෙම රථය ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව. | විධිමත් අනුමැතියකින් තොරව අපහරණ ක්‍රියාවලියෙන් මෙම වාහනය ඉවත් කරන ලද වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු අතර විධිමත් පරිදි වාහනය බැහැර කිරීම කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය 546 - මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

**1.5.2.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------------- | ------------- |
| (අ) | 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය හා 1992 අංක 01 දරන මධ්‍යම පළාතේ සංශෝධන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 1991 වසරේ සිට 2010 දක්වා අයකරගෙන නොමැති රු.15,837,732 ක හිඟ පිරිවැටුම් බදු 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂ 15 කට අධික කාලයක් ගතව ඇතත් එකතු කිරීමට අපොහොසත් වී තිබුණි. | ව්‍යාපාර පිරිවැටුම් බදු 2010 වසරේ අයවැය යෝජනා මඟින් අහෝසි වන ලිපිගොනු 2264 කට අදාළව රු.353,816,460 ක හිඟ බදු ප්‍රමාණයක් පැවති අතර, මෙම හිඟ බදු ප්‍රමාණය 2025 දෙසැම්බර් 31 වන විට ලිපිගොනු 75ට අදාළව රු.15,837,732 දක්වා අඩු කරගෙන ඇත. ගොනු 5කට රු.4,490,048 ක නඩු පවරා ඇති අතර ගොනු 11 කට 3,878,142 ක් අය කරමින් ඇති අතර ගොනු 59 කට රු.7,469,452 ක් කපා හැරීමේ ලේඛණයට ඇතුළත් කර ඇති බව. | මුදල් ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේපල හුවමාරු කිරීම/විකිණීම පිළිබඳව රැස්කළ මුද්දර බදු සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 73(8) වගන්තිය යටතේ සිදුකර තිබුණු දේපල විකිණීම නැවත තක්සේරු කිරීම් වලට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 70,620,557 ක මුද්දර බදු මුදලින් රු. 30,130,932 ක් වර්ෂ 01 සිට වසර 05 කට අධික කාලයක් ගතවී තිබුණද, රැස්කර ගැනීමට පළාත් ආදායම් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අය විය යුතු හිඟ මුද්දර ගාස්තු අය කර ගැනීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වන බව. | මුදල් ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය**

**1.5.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ---------------------------------------- | ------------- |
| කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය විසින් මඟී ගිමන්හලක් පවත්වාගෙන යාම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සමග අවස්ථා තුනකදී එළඹ තිබූ ගිවිසුම්වල 16 වගන්තිය අනුව මඟී ගිමන්හල ඉදිකිරීමේ අවසරය හෝ ඉදිකල ගිමන්හලෙහි භුක්තිය වෙනත් අයෙකුට අතුරු බද්දට දීම, කොටසක් හෝ එසේ බදු දීම කල නොහැකි බවට දෙපාර්ශවයම එකඟවන බව දක්වා තිබුණි. එහෙත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය විසින් 2012 වර්ෂයේ සිට 2025 | පළමු පාර්ශවයෙන් අය කර ගත යුතුව ඇති මුදල වන රු.3,167,023.33 මුදල අය කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවත්, දෙවන පාර්ශවය විසින් ගෙවිය යුතු රු.681,634 ක හිඟ මුදල වාරික වශයෙන් ගෙවීම් කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇති බවත්, තෙවන පාර්ශවයෙන් අයවියයුතු ප්‍රමාද ගාස්තුව වන රු. 2,127,700/- ක මුදල සම්බන්ධයෙන් නැවත කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණයක් | ගිවිසුමේ 16 වැනි වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම සහ හිඟ බදු කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වර්ෂය දක්වා අවස්ථා 05 කදි ගිවිසුම්ගතව කටුකිතුල මගී ගිමන්හල පවත්වා ගෙන යාමට වෙනත් පුද්ගලයන්හට බදු දී තිබුණු අතර 2025 වර්ෂයේ අවසානයට වර්ෂ 01 ත් 10 ත් අතර කාලයක සිට බදුකරුවන් තිදෙනෙකුගෙන් එකතුව රු.5,976,357 ක බදු කුලී මුදලක් හිඟව පැවතුණි. | ගැනීමට නියමිත බව. |

**1.5.3.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත් සභාවේ 2008 අංක 01 දරන මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තියෙහි 05 වගන්තිය අනුව රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කළ යුතු බව සඳහන් කර තිබුණද කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පිහිටුවා වසර 17 ක් ගත වී ඇතත් බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කර නොතිබුණි. | පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර කළමනාකරණ මණ්ඩල අනුමැතියට යොමු කර ඇති බව. | ප්‍රඥප්තියෙහි 05 වගන්තියේ විධිවිධාන අනුව කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කළ අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය - 550 - මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය**

**1.5.4.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 104(4) හා මධ්‍යම පළාත් මූල්‍ය රීති 54.6 | අලාභ හානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළතදී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද, අදාළ සිදුවීම් සිදුවී මාස 03 සිට අවුරුදු 26 ක කාලයක් ගතව තිබුණද, අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට අසමත්ව තිබූ අවස්ථා 56 ක් තිබුණි. | ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ආයතන 1500 කට වැඩි ප්‍රමාණයක් පැවතීමත්, එම ආයතන වලින් වාර්තා වන සිදුවීම් සියල්ල පිළිබඳව පරීක්ෂා සිදු කිරීමට සුදුසු නිලධාරීන් සීමිත ප්‍රමාණයක් සිටීමත්, එම නිලධාරීන්ට පැවරී ඇති රාජකාරි ඉටුකරන අතරතුර මෙම පරීක්ෂණ සිදු කිරීමට සිදුවීම නිසා අලාභ හානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වීම් | මුදල් රෙගුලාසි හා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

වළක්වා ගැනීමට කටයුතු කරන බව.

**1.5.4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනාධිපති කාර්යාලයේ මූලිකත්වයෙන් ජාතික වශයෙන් ක්‍රියාත්මක කරන ලද ග්‍රාම ශක්ති වැඩසටහනේ ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා පළාත් ප්‍රධාන අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මලබාර් හවුස් නිල නිවස රු.325,000ක මාසික කුලියකට 2019 මාර්තු 15 දින සිට 2019 දෙසැම්බර් 22 දින දක්වා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සහ උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයෙකු වෙත ලබාදී තිබුණද අදාළ කාලසීමාව වෙනුවෙන් ලැබිය යුතු රු.2,925,000ක කුලී මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 06කට අධික කාලයක් ගත වී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස පළාත් ප්‍රධාන ලේකම් මඟින් ජනාධිපති ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර ඇති බව. | හිඟ කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය**

**1.5.5.1 කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කෙරෙන මහජන පුස්තකාල,අධ්‍යාපන පුස්තකාල සහ විශේෂ පුස්තකාල කටයුතු සැලසුම් කිරිම, සංවර්ධන කිරිම සහ සම්බන්ධීකරණය කිරිම පරමාර්ථ කර ගනිමින් දැනුම් කේන්ද්‍රස්ථානයක් වශයෙන් සේවාවන් සැපයීම සඳහා මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය ස්ථාපිත කොට වසර 20 කට අධික කාලයක් ගත වුවද, අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීම් පටිපාටි සකස් කර ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 ශීර්ෂය 551 - මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**1.5.6.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මධ්‍යම පළාත් මූල්‍ය රීති 54.6 | පරීක්ෂණ වාර්තාවන්ට අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකිරීමට නිර්දේශ ලබාදී වසර 01 ත් වසර 12 ත් අතර කාලයක් ගතවී ඇති සිද්ධීන් 15 කට අදාළ රු. 52,449,600 අලාභ හානි අදාළ පාර්ශව වෙතින් අයකර ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අයවීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අලාභ හානි වලට වගකිව යුතු පුද්ගලයන්ගෙන් අලාභ අයකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවලට අදාළව පළාත් පාලන ආයතනවල සිදු කර තිබූ රු.8,666,576 අක්‍රමිකතා සඳහා මූලික විමර්ශණ පැවැත්වීමට අදාළ කමිටු පත්කර මාස 09 සිට අවුරුදු 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණු සිද්ධි 12 කට අදාළව මූලික විමර්ශණ වාර්තා සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | සිද්ධි 12 ට අදාළ පරීක්ෂණ සිදු කරමින් පවතින බවත්, එම පරීක්ෂණ කඩිනමින් අවසන් කර ඊට අදාළ වාර්තා ලබාදෙන ලෙස පරීක්ෂණ කමිටු දැනුවත් කර ඇති බව. | මූලික විමර්ශන කාලීනව සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.6.3 නොවිසඳී ඇති විගණන ඡේද**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 ඔක්තෝබර් 15 සිට 2022 සැප්තැම්බර් 16 දක්වා වන කාලය තුළ වූ සිද්ධි 08 කට අදාළව මධ්‍යම පළාත්, පළාත් පාලන ආයතන වෙත නිකුත් කර තිබූ අධිභාර වට්නාකමින් අභියාචනා පරීක්ෂණ අවසන් වූ නමුත් තීරණ ලබාදීම් අවසන් නොවීම මත සිද්ධි 03 කට අදාළ රු.4,850,710 ක් හා අභියාචනා තීරණ ලද පසුවත් අය නොකර | 2026 අගෝස්තු 15 දිනට රු.8,634,826 ක් තවදුරටත් අය විය යුතුව පවතින අතර එම අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අධිභාර කාලීනව අයකර, සිදු වී ඇති පාඩු පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

පවතින සිද්ධි 05 කට අදාළ රු.1,492,365 ක් ඇතුළත්ව රු.8,666,576 ක ශේෂයක් පැවතුණි.

### 1.5.7 ශීර්ෂය 552 - මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

#### 1.5.7.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2022 දෙසැම්බර් 11 දිනැති 2310/29 ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 125 වන රීතිය | පරිවාස කාලයට යටත්ව සිටින නිලධාරියෙකුගේ එම කාලය සම්පූර්ණ වූ වහාම අදාළ පරිදි ඔහුගේ පත්වීම ස්ථිර කිරීමට , පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට කටයුතු කළයුතු වුවද, කලාප කාර්යාල 07ක පරිවාස කාලය ඉක්මවා වර්ෂ 01 සිට වර්ෂ 34 දක්වා කාලසීමාවක් ගතවී ඇතත් නිලධාරීන් 108 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ස්ථිර කර නොමැති නිළධාරීන් 108 දෙනාගෙන් 18 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කර ඇත. 90 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කර නොමැත. මෙම නිලධාරීන් 90 දෙනා වෙත පෞද්ලික ලිපි ගොනු මගින් අදාළ අඩුපාඩු ලිඛිත දැනුම් දි ඇත. එම අඩුපාඩු සම්පූර්ණ වූ වහාම පත්වීම් ස්ථිර කිරීම සඳහා කටයුතු කරන බව. | කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අනුව නියමිත කාලය තුල පත්වීම් ස්ථිර කිරීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.7.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කලාප අධ්‍යාපන කාර්යාල 05කට ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු පැමිණිලි සහ පෙත්සම් 845ක් සම්බන්ධයෙන් විමර්ශන මණ්ඩල පත්කර ඇතත් පරීක්ෂණ කටයුතු නිමකර වාර්තා ලබාදී නොතිබුණි. | මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පවතින මානව සම්පත ප්‍රමාණවත් නොවීමත් රාජකාරීමය කාර්ය බහුලත්වය හේතුවෙන් එකවර නිලධාරීන් 3 දෙනෙකු සහභාගී වීමට ඇති අපහසුතාවය නිසා මෙම විමර්ශන වාර්තා ලබාදීම ප්‍රමාද වී ඇති බව. | පරික්ෂණ කටයුතු කාලීනව ඉටු කර වාර්තා ලබා දි ඉදිරි කටයුතු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.7.3 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------------------------- | ------------ |
| (අ) | විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව, 2025 වර්ෂයේ මධ්‍යම පළාතෙන් 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනීසිටි සිසුන් 40364 දෙනෙකු අතුරින් සිසුන් 5558 දෙනෙකු එනම් සියයට 13.77ක් කඩඉම් ලකුණ ඉක්මවා තිබුණු අතර එම ප්‍රතිශතය දිවයිනේ සමස්ත ප්‍රතිශතය වූ සියයට 17.11ට වඩා පහළ මට්ටමක පැවතුණි. දිවයිනේ පළාත් 09 සමඟ සැසඳීමේදී මධ්‍යම පළාත අවසාන ස්ථානයේ පැවති අතර, දිවයිනේ දිස්ත්‍රික්ක 25 සමඟ සැසඳීමේදී මහනුවර,මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක පිළිවෙලින් 20, 16 සහ 19 යන ස්ථාන හිමිකරගෙන තිබුණි. | 2020 සිට 2025 වර්ෂය දක්වා කඩඉම් ලකුණ සැලකීමේ දී ජාතික මට්ටමේ දී සියයට 14.46 සිට සියයට 13.77 දක්වා අඩුවීමක් පෙන්වයි. නමුත් මධ්‍යම පළාත එය සියයට 10.29 සිට සියයට 13.77 දක්වා වර්ධනය කරගෙන ඇත.2020 සිට 2025 දක්වා ලකුණු 70 හෝ ඉහළ ලකුණු ලබාගැනීම සැලකීමේ දී ජාතික මට්ටමේ එම ප්‍රතිශතය අඩු වන විට මධ්‍යම පළාතේ එම ප්‍රතිශතය අඩු විම සිදු වී ඇති බව. | පළාත තුළ විභාග ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මධ්‍යම පළාතෙන් සිසුන් 28,681 දෙනෙකු පෙනීසිට සිසුන් 18083 දෙනෙකු එනම් සියයට 63ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණු අතර එය දිවයිනේ සමස්ත ප්‍රතිශතය වූ සියයට 66 ට වඩා පහළ මට්ටමක පැවතුණි. තවද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය අනුව දිවයිනේ දිස්ත්‍රික්ක 25 අතුරින් මධ්‍යම පළාතේ නුවරඑළිය, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්ක පිළිවෙලින් 18,14 සහ 22 යන ස්ථාන හිමිකරගෙන තිබුණි. | 2020 සිට 2025 වර්ෂය දක්වා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ගැනීම සැලකීමේ දී ජාතික මට්ටමේ දී සියයට 65.98 සිට 66.12 දක්වා සියයට 0.14 ක වර්ධනයක් පෙන්වයි. නමුත් මධ්‍යම පළාත එය සියයට 63.79 සිට 63.05 ක් , එනම් සියයට 0.74 ක පහළ යාමක් පෙන්වයි. 2020 සිට 2025 දක්වා සියලු විෂයයන් අසමත් ප්‍රතිශතය සැලකීමේ දී ජාතික මට්ටම සියයට 8.64 සිට 8.72 ක් දක්වා සියයට 0.08 කින් එම අගය වර්ධනයක් පෙන්වයි. එලෙසම මධ්‍යම පළාත සියයට 8.37 හි සිට 9.37ක්, එනම් සියයට 1 කින් වර්ධනයක් පෙන්වන බව. | පළාත තුළ විභාග ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 553 - මධ්‍යම පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව**

**1.5.8.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 38 න් 35ක එකතුව රු.125,505,050 ක හිඟ බදු ශේෂයක් අයවිය යුතු ව පැවතුණි. ඉන් එකතුව රු. 120,427,573 ක හිඟ බදු ආදායමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක බදුකරුවන්ගෙන් අයකර ගත යුතුව පැවති අතර එය මුළු හිඟ බදු ආදායමෙන් සියයට 96 ක් විය. 2025 දෙසැම්බර් 31 දිනට ආදායම් කාල විශ්ලේෂණය අනුව මුළු හිඟ බදු ආදායමින් සියයට 48 ක් එනම් රු.60,137,125 ක් වර්ෂ 3ට වඩා කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ බදු ශේෂයන් 2025 පෙබරවාරි 28 දින වන විට රු. 15,246,668 ක් අයකර ගෙන ඇති බවත් තවදුරටත් රු.110,258,382 ක් අය වීමට ඇති බව. | තවදුරටත් හිඟ බදු ශේෂ අය කර ගැනීමට අදාළව කටයුතු කළ යුතුය. |
| (ආ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාගල ග්‍රාම නිලධාරි වසමේ හේරත්පුර ජනපදය ගමේ මු.පි.නු. 880 පිඹුරේ කැබලි අංක 01 හා 02 දරන ප්‍රමාණයෙන් පර්චස් 47 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස් පුද්ගලයෙකු වෙත වාණිජ කටයුතු සඳහා 2010 ජනවාරි 01 දින සිට ඉදිරියට අවුරුදු 30 ක කාලයක් සඳහා ද ඉහත පිඹුරේ කැබලි අංක 03 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා 2010 ජනවාරි 01 දින සිට ඉදිරියට වර්ෂ 30 ක කාලයක් සඳහා ද බදු දීමට අනුමැතිය ලැබී තිබුණු අතර මෙම ඉඩම්වලින් 2026 අප්‍රේල් 02 දින වන විට එකතුව රු. 33,707,032 ක හිඟ බදු ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | නිසි පරිදි බදු මුදල් නොගෙවීම මත බදු අනුමැතිය අවලංගු කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ යොමු කර ඇති බව හා බදු අනුමැතිය අවලංගු කළ පසු හිඟ බදු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නේවාසික කටයුතු සඳහා පුද්ගලයන් 20 දෙනෙකු සඳහාද කෘෂිකාර්මික කටයුතු සඳහා පුද්ගලයන් 18 දෙනෙකු වශයෙන් පුද්ගලයන් 38 දෙනෙකුට රජයේ ඉඩම් බදු දීම සඳහා 1995 වර්ෂයත් 2015 වර්ෂයත් අතර කාලය තුළ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී තිබුණි. මෙම අනුමැතිය ලැබී වර්ෂ 10 ත් | 2025 අප්‍රේල් 02 දින එක් බදු කරුවකු විසින් රු. 137,280 ක බදු මුදලක් ගෙවා ඇති බවත් ඉතිරි බදුකරුවන්ගෙන් බදු අය කර ගැනීමේ කටයුතු විවිධ අදියර වල පවතින බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ 30 ත් අතර කාලයක් ගත වී ඇතත් මෙතෙක් මෙම පුද්ගලයන්ගෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝබර් 22 දිනැති අංක 2021/06 දරන චක්‍රලේඛය අනුව අය කළ යුතු බදු මුදල් නිශ්චය කර නොතිබූ අතර තවත් බදු කරුවන් 06 දෙනෙකු සඳහා කමිටුවක් මඟින් තක්සේරු වාර්තා ලබා දී තිබුණද 2026 පෙබරවාරි 17 දින වන විටත් එම තක්සේරුව අනුව තවදුරටත් රු.2,063,000 ක බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | | |
| (ඇ) | ගහවටකෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බුවැලිකඩ ග්‍රාම නිළධාරි වසමේ වාණිජ පදනම මත 2002 ජුලි 01 දින සිට ඉදිරියට අවුරුදු 30 ක කාල සීමාවක් සඳහා පුද්ගලයෙක් වෙත දීර්ඝකාලීන බදු ලබාදී තිබුණද 2020 වර්ෂයේ සිට 2025 ඔක්තෝබර් 31 දින දක්වා රු.23,941,440 ක බදු මුදලක් ද අම්පිටිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ රජයේ ඉඩමක් සුහසාධන කටයුතු සඳහා 2021 ජනවාරි 01 දින සිට ඉදිරියට වර්ෂ 30 ක කාලයක් සඳහා පෞද්ගලික පාර්ශවයකටද බදු දී තිබූ නමුත් මෙම බදුකරුගෙන් 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රු.14,750,000 ක බදු මුදලක් හා රු.1,075,000 ක පොළී මුදලක් ද වශයෙන් එකතුව රු. 15,825,000 ක මුදලක් ද අයවිය යුතුව පැවතුණි. | බුවැලිකඩ වසමේ බදුකරය අවලංගු කර ලියාපදිංචි කිරීමට සහ අම්පිටිය බදු කරුගේ බදු මුදල් සංශෝධනය සඳහා දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කර ඇති බවත් ඒ අනුව හිඟ බදු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රිකිල්ලගස්කඩ ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර 0.015 ක් පමණ වූ රජයේ ඉඩම වාණිජ කටයුතු සඳහා පුද්ගලයෙකු වෙත 1995 ජුනි 15 දින සිට ඉදිරි වසර 30 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු ලබාදී තිබූ බදුකාරිය විසින් බදු මුදල් නොගෙවීම මත 2026 ජනවාරි 08 දින වන විට අයවීමට ඇති රු.2,142,000 ක බදු හා දඩ මුදලක්ද රිකිල්ලගස්කඩ ග්‍රාම නිලධාරි වසමේ හෙක්ටයාර 0.0183 ක ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා පුද්ගලයෙකු වෙත 1995 ජුනි 15 දින සිට ඉදිරි වසර 30 ක කාලයක් දක්වා දීර්ඝ කාලීන බදු ලබා දි 2025 ජුනි 14 දින වන විට රු.5,052,980 ක බදු හා දඩ මුදලක් ද | හිඟ මුදල් අයකර ගැනීමට ඉඩම් කොමසාරිස් වෙතින් උපදෙස් විමසා ඇති බව. | හිඟ ආදායම් අය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

රු.179,960 ක වාර මුදලක් ද අයවිය යුතුව පැවතුණි. ඉන් 2026 ජනවාරි 07 දිනවන විට තවදුරටත් රු.2,553,540 ක් අයවිය යුතුව පැවතුණි.

**1.5.8.2 මෙහෙයුම් ආකර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව මධ්‍යම පළාතේ පිහිටි පාසල් 58 ක ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22කට රු.64,725,690 ක මුදලක් යවා තිබුණි. 2025 ඔක්තෝබර් 31 දින වන විට පාසල් 13 කට අදාළව රු.8,140,346 ක මුදලක් ආපසු ගෙන්වා ගෙන තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 ක රු.42,247,719 ක පාසල් ඉඩම් 36 ක අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව අත්පත් කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් වසර 3-4 ක පමණ කාලයක් ගත වන බව හා පාසල් 36 හි අත්පත් කර ගැනීමේ කටයුතු විවිධ අදියර වල පවතින බව. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු පිළිබඳ නිතර පසු විපරම් කරමින් අදාළ කාර්යය කඩිනම් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 554 - මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**1.5.9.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2025 මාර්තු 17 දිනැති අංක 07/2025 දරන රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා සම්පත් දායක දීමනා ගෙවීම් කිරීමේදී චක්‍රලේඛයේ සඳහන් විධි විධාන වලට පටහැනිව රු.1,003,150 ක් ගෙවීම් කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දීම හා 2026 මාර්තු 05 දින පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා වූ පරිදි මින් ඉදිරියට වැඩසටහන් සඳහා ගෙවීමට අවශ්‍ය දීමනා ගණනය කර ගෙන එම දීමනා ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නීතියට පටහැනිව කරන ලද ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය - 556 - මධ්‍යම පළාත් සංචාරක දෙපාර්තමේන්තුව**

**1.5.10.1 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සංචාරක දෙපාර්තමේන්තුව විසින් දඹුල්ල සංචාරක කලාපය වෙත පැමිණෙන විදේශීය සංචාරකයින් හා ප්‍රදේශය තුළ සිටින දේශීය ජනතාව වෙත ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් 2016 වර්ෂයේදි රු.7,948,336 ක් වැයකර ආයුර්වේද හා සංචාරක පහසුකම් මධ්‍යස්ථානයක් රංගිරි දඹුලු රජමහා විහාරයට අයත් ඉඩමක ඉදිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර මධ්‍යස්ථානය ඉදිකර වර්ෂ 09 ක කාලයක් ගත වී තිබුණද අරමුණු ගත කාර්යය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | මෙම ව්‍යාපෘතිය ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා දඹුල්ල මහා නගර සභාව වෙත පවරා දීමට කටයුතු කරමින් පවතින බව. | වත්කම් ඵලදායී ලෙස අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉදිරියේදි ඉදිකිරීම් කිරීමට පෙර ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 583 - මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව**

**1.5.11.1 ප්‍රමාද වු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුවරඑළිය මහ නගර සභාව සතු වත්කමක් ලෙස ගිණුම්වල පෙන්වනු ලබන නුවරඑළිය සිනිසිටා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව මගින් රු. මිලියන 3.1 ක ප්‍රතිපාදනයක් සලසා දී තිබුණි . 2025 වර්ෂය තුළ ඉටු කිරීමට බලාපොරොත්තු වූ සංවර්ධන වැඩ විෂයන්ට අදාළව නුවරඑළිය මහ නගර සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ පවා නොමැති ව්‍යාපෘතියක් වෙනුවෙන් 2026 ජනවාරි 20 දින රු.2,031,975 ක මුදලක් ද්‍රව්‍ය මිලදීගැනීම සඳහා වැය කර තිබුණද, පරීක්ෂණ දිනය වූ 2026 ජුලි 21 දක්වාම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරිම පවා සිදුකර නොතිබුණි. | දිවිවා සුළි කුණාටුව හේතුවෙන් සිනිසිටා ගෘහස්ථ ක්‍රීඩාංගන භූමිය රැඳවුම් මධ්‍යස්ථානයක් වශයෙන් පවතින අතර ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින බව. | මිලදී ගත් දැව හා උපාංග නියමිත කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |

### 1.5.11.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි වැඩපිළිවෙලක් හා ශක්‍යතා අධ්‍යනයක් නොමැතිව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් ප්‍රතිපාදන වෙන්කර ගෙන මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවට ජූඩෝ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ අරමුණින් ගම්පොල බාලිකා විද්‍යාලයක ගොඩනැගිල්ලක් රු.1,992,319 ක මුදලකින් අළුත්වැඩියා කර ඇතත්, අරමුණුගත කාර්යය වෙනුවෙන් මෙම ගොඩනැගිල්ල භාවිතා කර නොතිබුණි. | දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ගොඩනැගිල්ල පිහිටි භූමිය අධි අවධානම් කලාපයක් ලෙස නම් කර ඇති බැවින් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි බව. | වත්කම් ඵලදායි ලෙස අරමුණු ගත කාර්යය සඳහා භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිගන ක්‍රීඩා සංකීර්ණයේ ත්‍රිභාෂා ආයතනික වෙබ්අඩවිය ස්ථාපනය හා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා රු.1,351,750ක වටිනාකමකට පෞද්ගලික ආයතනය වෙත භාරදී තිබුණි. ගිවිසුම් අත්සන් කළ දින සිට සති 15 ක කාල පරිච්ඡේදයක් තුළ පිරිවිතරයන්ට අනුකූලව අදාළ පද්ධතිය නිම කර භාරදිම සඳහා සැපයුම්කරු ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබුණද, විගණිත දිනය වූ 2026 මාර්තු 09 දින වන විටත් නිසි පරිදි පද්ධතිය ආයතනය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණු අතර, පිරිවිතරවල සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබියදී 2024 දෙසැම්බර් 31 දින රු.1,230,050 ක මුදලක් ද මාර්ගගත ගෙවීම් පද්ධතිය සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීම වෙනුවෙන් 2025 දී නැවත රු.1,047,500 ක මුදලක් ද අදාළ ආයතනය වෙත ගෙවීම් කර තිබුණි. ගිවිසුම අත්සන් කරන ලද දිනය වූ 2025 පෙබරවාරි 07 දින සිට මේ දක්වා වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදි දෝෂයන් පවතින බැවින් එමගින් ජනනය වන දත්තයන් පිළිබඳව විශ්වසනීයත්වයක් තැබිය නොහැකි අතර මෙම පද්ධතිය වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විට ගෙවා ඇති රු.2,399,250 ක මුදල ඌන උපයෝජිත වියදමක් වී තිබුණි. | පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ දී පවතින දෝෂ පිළිබඳව මෙතෙක් අභ්‍යන්තර තහවුරු වීමක් සිදු වී නොමැති අතර ප්‍රායෝගිකව දෙපාර්තමේන්තුවට පැන නගින අවශ්‍යතාවන්ට අනුකූලව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවලින් බැහැර වීම මත, ස්ථාපිත කර ඇති පද්ධතිය සඳහා නිශ්කාර්යව දැරීමට සිදුවී ඇති මුදලට අදාළ වගකිව යුත්තන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා පවතින දෝෂ නිවැරදි කර වත්කම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**1.5.12.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි 02(IV) වගන්තිය හා 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 හි 04 වගන්තිය | චක්‍රලේඛ විධි විධාන වලට පටහැනිව මධ්‍යම පළාතේ සියලුම මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල,ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය හා කඩුගන්නාව පුහුණු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් කාලය සනාථ කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.3,170,638,901 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | රෝහල් ඇතුළු මෙරට කිසිදු සෞඛ්‍ය ආයතනයක ඇඟිලි සළකුණු යන්ත්‍ර ක්‍රියාත්මක නොවන අතර, පැමිණීම සටහන් කරනු ලබන ලේඛන මඟින් පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් තහවුරු කරගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදුකරනු ලබන බව. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කරවා ගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. |

**1.5.12.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2023 හා 2024 වර්ෂවලදී සේවය අත්හැරගිය නිලධාරීන් 06 දෙනෙකු ගිවිසුම් කඩකිරීම හේතුවෙන්, අයකරගත යුතු රු. 3,959,212 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | දණ්ඩන මුදල් ගෙවන ලෙස දන්වා ඇති බව. | රජයට අය විය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දඹුල්ල දිස්ත්‍රික් මූලික රෝහලේ සේවය හැරගිය හෙද/පරිපූරක හා අතුරු වෛද්‍ය සේවයේ නිළධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.4,686,285 ක දණ්ඩන මුදලක් අය නොවී 2026 පෙබරවාරි 09 දිනවන විට වර්ෂ 01 සිට වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණි. | ගෙවීම් කරන ලෙස දන්වා යවා ඇති බව. | රජයට අයවිය යුතු දණ්ඩන මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්කවල පිහිටි මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල් , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, හා ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවල 2025 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලයේ දී, ඖෂධ වර්ග 396 කට අදාළව ඖෂධ 3892161 ක ප්‍රමාණයක් විවිධ හේතු මත කල් ඉකුත් වී තිබූ අතර එහි වටිනාකම රු.29,977,842 ක් විය. එමෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් සෞඛ්‍ය ආයතනවල, වටිනාකම හඳුනාගත නොහැකි ඖෂධ වර්ග 18 කට අදාළව ඖෂධ 445438ක ප්‍රමාණයක් කල් ඉකුත් වී තිබුණි. | වර්තමානය වන විට රෝහල් ඇතුළු සෞඛ්‍ය ආයතනවල ඖෂධ කළමනාකරණය ස්වස්ථ ඖෂධ කළමනාකරණ පද්ධතිය මඟින් සිදුවන බැවින් ඖෂධ කල් ඉකුත් වීම සැළකිය යුතු මට්ටමකින් අඩු වී ඇති අතර ඖෂධ කල් ඉකුත්වීම සඳහා නිලධාරීන්ගේ යම් නොසැළකිල්ලක් හෝ අනවධානයක් හේතු වී ඇත්නම් එම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම මේ වන විට ආරම්භ කර ඇති බව. | පරීක්ෂණ පවත්වා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා සිය රාජකාරි වෙනුවෙන් වැටුප්, දීමනා හා ක්ෂේත්‍ර රාජකාරි සඳහා දින 18ක පරිවර්ථීත ගමන් වියදම් දීමනා ගෙවීමට ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර තිබුණ ද ඊට අමතරව එකතුව රු.3,663,787ක් ඉන්ධන දීමනා ලෙස පළාත් පාලන ආයතනවලින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු වෙත ආණ්ඩුකාරවරයාගේ හෝ වෙනත් විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් පළාත් පාලන ආයතන වල සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ආකාරය පිළිබඳ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති අතර ඉන්ධන දීමනා ලබා දෙන්නේනම් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගන්නා ලෙසත්, ද්විගණනය නොවන පරිදි උපරිම දින ගණනක් තීරණය කර සංයුක්ත දීමනා ගෙවීමට සුදුසු බව පළාත් පාලන කොමසාරිස් විසින් සියළු පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති අයුරින් ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ වරුන් වෙත දන්වා ඇති බව. | විධිමත් අනුමැතියකින් තොරව සිදු කරන ලද ගෙවීම් අය කිරිමට කටයුතු කළ යුතු අතර විවිධ දීමනා ගෙවීමට පූර්වයෙන් විධිමත් අනුමැතිය ඒ සඳහා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12.5 දූෂණ අක්‍රමිකතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------------- | ------------- |
| (අ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය මගින් සෞඛ්‍ය උපකරණ වල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදල 2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද ඉන් නිළධාරින් 04 දෙනෙකුගෙන් එකතුව රු.1,345,482 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණය අනුව නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු.1,787,605 ක මුදලක් අයවී ඇති අතර තව දුරටත් එක් නිලධාරියෙකුගෙන් රු.1,327,300 ක් අය විය යුතුව පවතී. එම මුදල අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති බව. | රජයට අයවිය යුතු ලෙස නිර්දේශ කර ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ වැටුප් සැකසීමේදී වැටුප් රාජකාරී ඉටු කළ නිළධාරින් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ හා සමීපතමයන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු. 51,961,083 ක් සහ බැංකු ගිණුම් අංක මගින් තහවුරු නොවන රු.1,077,550 ක් වශයෙන් එකතුව රු.53,038,638 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබූ අතර එම මුදලින් තවදුරටත් රු. 49,115,857 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | මේ වන විට අයකර ගෙන ඇති මුළු මුදල රු.3,922,781 ක් වන අතර තව දුරටත් අයකර ගැනීමට ඇති මුදල රු. 49,115,857 ක් වේ. මු.ර 104 වාර්තා පදනම් කරගෙන සිවිල් නඩුවක් පැවරීමේ කටයුතු සඳහා ප්‍රධාන ලේකම් විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නඩු අංක B 62101/21 ගොනුකර ඇත.පළමු උප ලේඛනය යටතේ චෝදනා ගොනු කර ඇති නිලධාරීන් සංඛ්‍යාව 05 ක් වන අතර ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 25 වන වගන්තිය අනුව කටයුතු කිරීමට නිර්දේශිත නිලධාරීන් සංඛ්‍යාව 20 දෙනෙක් බව. | අධිභාර කළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12.6 අතහැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------------- | ------------- |
| රුපියල් මිලියන 70 ක ඇස්තමේන්තුවක් මත 2021 වර්ෂයේදි ගිවිසුම්ගත, විල්ගමුව ප්‍රාදේශීය රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේදි රු.මිලියන 14.5 කට අදාළ වැඩ කොටස් පමණක් නිමකර ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින බව. | ව්‍යාපෘතිය අවසන් කරවා ගෙන ඉදිරියේදි භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12.7 නිශ්ක්‍රීය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------------------- | ------------- |
| (අ) | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රතිපාදන මත 2016 වර්ෂයේදී රු.27,897,425 ක වියදමින් ඉදිකර, ලග්ගල ප්‍රාදේශීය රෝහල වෙත භාර දී තිබූ මෘත ශරීරාගාරය, රු.49,552,886 ක වියදමින් ඉදිකර තිබූ ආපනශාලා ගොඩනැගිල්ල හා කාමර 8 කින් සමන්විත නව ශලාහාගාර ගොඩනැගිල්ලේ කාමර 02 ක් හැර අනෙකුත් සියලු කාමර භාවිතයට නොගෙන වර්ෂ 08 කට අධික කාලයක් ද රෝහලේ ඉදිකර තිබූ වාට්ටු සංකීර්ණයේ වර්ග අඩි 8928 ක පමණ ප්‍රමාණයෙන් යුතු ළමා හා මාතෘ රෝගීන් සඳහා වෙන්කර තිබූ වාට්ටු 02ක් වසර 02 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවති අතර කාමර 05 කින් සමන්විත අංග සම්පූර්ණ මුළුතැන්ගෙයට අදාළ ගොඩනැගිල්ල ද භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | නිශ්කාර්යව පවතින වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදලින් ක්‍රියාත්මක සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල දිස්ත්‍රික් මූලික රෝහල ප්‍රමුඛව ප්‍රාදේශීය රෝහල් 11 ක, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක 4 ක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 4 ක පොකුරු පද්ධතියක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම සෞඛ්‍ය ආයතන 20 සඳහා USD 188,551.8 ක් හෙවත් ආසන්න වශයෙන් රු 60,567,420 ක වටිනාකමැති පරිගණක යන්ත්‍ර 382 ක් 2023 නොවැම්බර් මස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිලට ගෙන සෞඛ්‍ය ආයතන වෙත ලබා දී තිබුණි. මෙම පරිගණක ලැබී වසර 2 කට ආසන්න කාලයක් ගතව තිබුණ ද, Open MRS වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් රෝහල් වල විවිධ ස්ථාන වල මෙම පරිගණක යන්ත්‍ර නිශ්ක්‍රීයව පවතින අතර ඒවායේ වගකීම් කාලය හා ආරක්ෂාව සම්බන්ධව ද ගැටලු පැවතුණි. | මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කරමින් පවතින බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර උපකරණ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 563 – මධ්‍යම පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

**1.5.13.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අංක 04 දරන මධ්‍යම පළාත් සභාවේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 22 ඡේදය | අනාථ, අත්හල, අසරණ සහ අධිකරණ නියෝග මත භාරය සහ ආරක්ෂාව අවශ්‍ය ළමයි සඳහා වාසස්ථාන පහසුකම් සහ ආරක්ෂාව සැපයීම සහ ඒ හා සමාන වූ කාර්යයන් සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා ද ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරකම් කර ගෙන යාම සඳහා සහ කාර්යයන් ඉටු කිරීම සඳහා යම් මූල්‍ය ප්‍රභවයන්ගෙන් හෝ පරිත්‍යාග මඟින් ලබා ගන්නා යම් මුදල් හෝ අරමුදල් කොමසාරිස්වරයාව භාවිතා කළ හැකි වුවත් ඊට පටහැනිව සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු නොලබන ස්වේච්ඡා සංවිධාන මඟින් පවත්වාගෙන යනු ලබන ළමා නිවාස හා වැඩිහිටි නිවාස 09 ක ඉදිකිරීම් සඳහා රු.55,411,364 ක පළාත් සභා අරමුදල් යොදවා තිබුණි. | දරුවන් හා වැඩිහිටියන් රඳවා තබා ගැනීමට ප්‍රමාණවත් තරම් ඉඩ පහසුකම් දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර, යම් දිරි ගැන්වීමක් ලෙසද මෙම නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන රජය විසින් වෙන් කරනු ලබන බව. | ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 570 – මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය**

**1.5.14.1 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය රු.9,673,700ක් යොදවා ජල විදුලි බලාගාර 09ක් ස්ථාපිත කර ඇතත් වසර 6ත් 14ක් අතර කාලයක් තුළ දී එම බලාගාර අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි. | මේ සම්බන්ධව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය, ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, තක්සේරු දෙපාර්තමේන්තුව, බලාගාර පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභාවේ විදුලි ඉංජිනේරු හා නීති නිලධාරි යන අය ඇතුළත්ව පත් කර ඇති කමිටුව සහභාගි කර ගනිමින් සාකච්ඡා සිදු කර සියළුම ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට කටයුතු කරන බව. | අක්‍රීය ජල විදුලි බලාගාර ක්‍රියාකාරී තත්ත්වයට පත්කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

**1.5.15.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මධ්‍යම පළාත් සභාවේ 2018 අංක 03 දරන මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 15(2)(i) වගන්තිය අනුව පළාත තුළ පිහිටි බස් නැවතුම්පළවල් 61 කින් බස් නැවතුම්පළවල් 54ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | බස් රථ නැවතුම්පොළවල් 04 ක් පවරා ගෙන ඇති අතර ඉතිරි නැවතුම් පොළවල් වල අයිතිය පවරා ගැනිමේ විවිධ ගැටළු ඇති වී ඇති බව. | ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු ආදායම් තුළ පවතින 2018 වර්ෂයේ සිට අය නොවන රු. 5,869,100ක පාසල් බස්රථ ආදායම හා පාසල් සේවා අධිභාර රු.2,762,500ක ශේෂය අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට නියාමනය නොවන නිසා හිඟ ආදායම කපා හැරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2025 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.17,640,702ක කඩ කාමර කුලීය හා වසර 02කට අධික කාලයක සිට අය නොවන කඩ කාමර කුලීය රු.10,986,850ක් විය. | ඉදිකර නොමැති කඩ කාමරවල හිඟ ගණනය නොකිරීමට හා අධිකරණ තීන්දු අනුව කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

**1.5.15.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිංහල සහ හින්දු අලුත් අවුරුදු සඳහා 2025 වාර්ෂික ඇස්තමේන්තුවේ සුභසාධන වියදම් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 04ක ප්‍රතිපාදන මුදලින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ විධිමත් පදනමකින් හා ක්‍රමවේදයක් භාවිතා නොකර එක් වියළි ආහාර ද්‍රව්‍ය බඩු මල්ලක් රු.15,000ක් බැගින් මූල්‍ය ආධාර ලෙස මුදලින් නිලධාරීන් 212 ක් සඳහා රු.3,180,000 වියදමක් දරා තිබුණි. | ඉදිරියේදි මෙවැනි ගෙවීම් කිරීමේදි ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබන බව. | අනීතිකව සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් විධිමත්ව හා අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අන්තර්වාර බස්රථ මෙහෙයුම් උපදේශන ව්‍යාපෘතිය යටතේ දෛනික පදනමින් මගී ප්‍රවාහන ධාරිතාවය, මගීන් වැඩි ප්‍රමාණයක් ගමන් කරන මාර්ග හා ගමන් කරන වේලාව මෙන්ම මගීන් වැඩි ප්‍රමාණයක් ගමන් කරන නැවතුම් පොල ස්ථාන හඳුනා ගනිමින් බස් රථ යෙදවීම හා කාල සටහන් සකස් කිරීමට අවශ්‍ය පහසුකම් ETM යන්ත්‍ර භාවිතයෙන් ලබා ගත හැකි වුවද ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ මෙම දත්ත පද්ධතියෙන් බස් කළමනාකරණ දත්ත පද්ධතියට (BMS) ලබාදීමට සම්බන්ධ කර ඇති බව අධිකාරියේ කළමනාකාරිත්වය විසින් සඳහන් කළ ද පද්ධතිය මගින් මෙතෙක් වාර්තාවක් හෝ විශ්ලේෂණයක් ලබා දී නොතිබීම හේතුවෙන් එම මෘදුකාංග සඳහා වැය කළ රු.9,257,385 ක වියදම සහ SIM බිල්පත් සඳහා වැය කළ රු10,924,600 ක වියදම නිශ්කාර්ය වී තිබුණි. | මෙම බිල්පත් ගෙවීම නතර කළ හොත් ETM යන්ත්‍ර මගින් මගී ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සිදු කළ නොහැකි බව සඳහන් කරන අතර, BMS පද්ධතිය වෙත තොරතුරු නොලැබෙන බව. | BMS පද්ධතිය මඟින් තොරතුරු ලබාගෙන දත්ත විශ්ලේෂණය කරන බව තහවුරු කිරීම සඳහා පළමු ගිවිසුමේ සිට ලබා ගත් තොරුතුරු හා ඒ මත සිදු කරන ලද වෙනස්කම් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

**1.5.16.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි අක්කර 01යි පර්චස් 32.70ක් විශාල ඩෙවොන් එස්ටේට් ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ ඉඩම 2018 අගෝස්තු 23 දින වර්ෂයකට රු.360,000කට බාහිර පාර්ශවයකට බදු දී තිබුණි. එම බදු ගිවිසුම අනුව 2021 අගෝස්තු 25 දින සිට 2025 ජනවාරි 16 දින දක්වා එක් දිනකට රු.5,000 බැගින් දින 1241 සඳහා අයවිය යුතු රු.6,205,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා අතර අදාළ බදු ගැණුම්කරු ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ බැවින්, නීතිමය කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනවිට ගෙන ඇති බව. | හිඟ බදු කුළී අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගම්පොළ බහුකාර්ය ගොඩනැගිල්ල 2024 සැප්තැම්බර් 01 වන දින සිට වසර 15කට බදු දී තිබුණද බදු ගැණුම්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව බදු කුලිය නොගෙවීම මත 2026 ජුලි වන විට ගම්පොළ ව්‍යාපාරික ගොඩනැගිල්ල කුලියට දීමෙන් ලැබිය යුතු කුළී ආදායම හා බදු ලෙස රු.43,497,688ක් අය විය යුතුව තිබුණි. | 2025 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලිය පමණක් රු.12,195,930ක් (VAT බදු , SSCL බදු සහ ප්‍රමාද ගාස්තු ද නොමැතිව) අය කර ගැනීමට 2026 ජුලි 09 දින නීතිපති දෙපාර්තමේන්තුවට නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹිස්ස පට්ටියගම මාර්ගය ඉදිකිරීමට (2+000 -3+500km) අදාළ වැඩ කොටස් 07ක් සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2025 වර්ෂයේ HSR රේටයන් හා සැසඳීමේදී රු.1,612,061ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබුණි. | අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර ඇත්තේ මුළු වටිනාකම සලකා බලා වන අතර අයිතම් වශයෙන් එකිනෙක විශ්ලේෂණය කිරීම අපහසුවන බව. | වර්ෂයේ HSR රේටයන් අනුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිංහල සහ හින්දු අලුත් අවුරුදු සඳහා 2025 වාර්ෂික ඇස්තමේන්තුවේ ගිවිසුම්ගතව සේවා (1411) වැය විෂයෙහි සුභසාධන වියදම් වෙනුවෙන් වෙන්කර තිබූ රු. මිලියන 10ක මුදලින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ විධිමත් පදනමකින් සහ ක්‍රමවේදයක් භාවිතා නොකර තෑගි පාර්සල් එකක් රු. 9,977 බැගින් පාර්සල් 580ක් සඳහා රු.5,786,660 ක වියදමක් දරා තිබුණි. | විගණනය විසින් පෙන්වා දුන් කරුණු පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන බව. | අනීතිකව සිදු කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් විධිමත්ව හා අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.4 අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මහනුවර මහ නගර සභාවට අයත් වටපුලුව දේවි පාරේ පැති බැම්මක් ඉදි කිරීම සඳහා එම පැති බැම්ම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නිත්තවෙල පාරේ පැති බැම්මක් ලෙස ව්‍යාජ තොරතුරු ශක්‍යතා අධ්‍යයන වාර්තාවට ඇතුළත් කර එය අනුමත කිරීමෙන් පසුව ඇස්තමේන්තු සකස් කර රු7,620,577 වටිනාකමට පෞද්ගලික ආයතන සමඟ ගිවිසුමකට බැඳී කොන්ත්‍රාත්කරුට පැති බැම්මේ කොටසක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,480,258ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 වන ශීර්ෂය අනුව මූලික විමර්ශන කමිටුවක් පත් කිරීම සිදු කර ඇත. එම කමිටුව මඟින් මූලික විමර්ශන වාර්තාව සාමාන්‍යාධිකාරි වෙත යොමු කිරීමෙන් පසු එහි සඳහන් නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ලබා ගන්නා බව සහ එසේ සිදු කරන ක්‍රියාමාර්ග පිළිබඳ ඉදිරියේදී විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ විධි විධාන ප්‍රකාරව නිලධාරින් සම්බන්ධව කටයුතු කළ යුතු අතර අදාළ මුදල මහනුවර මහනගර සභාවෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2007 ජනවාරි 18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ පළාත් මාර්ග කිලෝමීටර් 116.32ක ප්‍රමාණයක් නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා රාගල විධායක ඉංජිනේරු කාර්යාලය වෙත පවරා තිබුණු අතර, එම කිලෝමීටර් ප්‍රමාණයට අයත් නොවන, සීමා සහිත වලපනේ විවිධ සේවා සමුපකාර සමිති ගොඩනැගිල්ල වෙත ප්‍රවේශ මාර්ගය සහ පරිශ්‍රය අවට මීටර් 65ක පමණ කොටසක් අළුත්වැඩියා කිරීම සඳහා ඉංජිනේරු | මූලික විමර්ශනය සඳහා කමිටුවක් පත්කර ඇත. කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | මූලික විමර්ශන කමිටුවේ වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතුය. |

කාර්යාලය සතු රු.677,130ක වටිනා අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ මිනිස් ශ්‍රමය යොදාගෙන තිබුණි. මෙම අළුත්වැඩියාව 2025 මාර්තු මස ආරම්භ කර තිබුණු අතර, විගණනය විසින් 2025 අගෝස්තු 05 දින භෞතික පරීක්ෂාව සිදු කරන විට වර්ග මීටර් 460ක පමණ ප්‍රමාණයක් සඳහා ගල් ඇතිරීම සම්පූර්ණ කර තිබුණු අතර, වර්ග මීටර් 170ක පමණ කොටසක තාර ආලේපනය කර වැලි අතුරා වැඩ අවසන් කර තිබුණ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**1.5.17 ශීර්ෂය - 581 මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව**

**1.5.17.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **මධ්‍යම පළාත් මූල්‍ය රීති** 54.1.3 සහ 54.1.6 | 2025 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශන අනුව සමස්ත වටිනාකම රු.33,167,929 ක හානි හා පාඩු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර ඒ තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට පරීක්ෂණ කටයුතු අවසන් නොවී පවතින රු.19,111,147 ක ශේෂයක් ද පැවතුණි. | වසර 05 කට වඩා වැඩි කාලයක සිට පරීක්ෂණ කටයුතු අවසන් නොවී පවතින රු.19,111,147 ක ශේෂය මේ දක්වා නිරවුල් කර අවසන් කර නොමැති අතර ඇතැම් මුදල් මේ වන විට අය වෙමින් පවතින බවත්, මු.රෙ. පරීක්ෂණ අවසන් නොවූ හානි පාඩු සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | අලාභ හානි සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අදාළ අලාභ හානි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.17.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024-2028 පස් අවුරුදු ඒකාබද්ධ මධ්‍යකාලීන සැලැස්ම මඟින් දෙපාර්තමේන්තුව විසින් 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු 03ක් සපුරා ගැනීමට අපේක්ෂා කර තිබුණු අතර එම අරමුණු ළඟා කර ගැනීම සඳහා වූ ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI) ලෙස විකුණුම් ආදායම හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2028 වර්ෂය වන විට විකුණුම් ආදායම රු.මිලියන 126 දක්වා වර්ධනය කර ගැනීමට සැලසුම් කර | ආර්ථික අස්ථාවරත්වය, ස්වාභාවික අනතුරු හා ව්‍යවසනකාරී තත්ත්වය, කාර්මිකාවන්ගේ විවිධ ගැටළු වැනි සාධක මත පසුගිය වසරවල අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. | හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI) සපුරා ගැනීම තුළින් අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

තිබුණ ද පදනම් වර්ෂය වූ 2022 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂය වන විට සමස්ත විකුණුම් ආදායම රු. මිලියන 19.52 කින් එනම් සියයට 17 කින් පහත වැටී තිබුණු අතර, මෙලෙස වාර්ෂික විකුණුම් ආදායම ක්‍රමයෙන් පහත වැටීම හේතුවෙන් අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

**1.5.18 ශීර්ෂය 584 - මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1.5.18.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 අංක 02 දරන පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ I වන කොටසේ 08 (අ) සහ IV වන කොටසේ 20 වන වගන්ති | ප්‍රඥප්තියේ විධි විධාන අනුව 2025 දෙසැම්බර් 31 දින වන විටත් ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන බව. | ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයක් පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 අංක 02 දරන පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ I වන කොටසේ 08 (අ) 41 වන වගන්තිය සහ VII වන කොටසේ පොදු විධිවිධාන යටතේ වූ 40 හා 41වන වගන්ති | ප්‍රඥප්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව යටතේ 2025 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මකව පැවති ග්‍රාම සංවර්ධන සමිති 1742 ක්, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති 44 ක් සහ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල 37 ක කටයුතු විගණනය කිරීමක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දීමට අනුකූලව විගණනය කිරීමට සැලසුමක් සකස් කර විගණන කටයුතු සිදු කිරීමට ආරම්භක පියවර ගෙන ඇති බව. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව විගණන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.18.2 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 38 සඳහා නව ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචිය සඳහා සහතික නිකුත් කිරීම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ලියාපදිංචිය හා ඒ සඳහා සහතික නිකුත් | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ස්ථාපිත කිරීම් කටයුතු ආරම්භ කර ඇති බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

කිරීම, ග්‍රාම සංවර්ධන සමිති නැවත ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම, ග්රාම සංවර්ධන සමිති ප්‍රතිසංවිධානය කිරීම සහ සමිතිවල අරමුදල් නිදහස් කිරීමේ අවශ්‍යතාවය සඳහා මෘදුකාංගයක් නිර්මාණය කිරීම සඳහා රු. 2,926,000 ක් වැය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කර නොතිබූ අතර එමඟින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

### 1.5.19 ශීර්ෂය - 557 - මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

#### 1.5.19.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 43(1), 43(2) සහ 43(3) වගන්ති | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමිති 96 කින් සහ මාතලේ දිස්ත්‍රික්කයේ සමිති 02 කින් වර්ෂ 1 ත් 5 ත් අතර කාල පරිච්ඡේදයන්ට අදාළ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. | මාතලේ දිස්ත්‍රික්කයේ සමිති දෙක සඳහා ගිණුම් ඉදිරිපත් නොකිරිමට කරුණු විමසමින් ලිපි යැවීම හා අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීම සිදුකර ඇත. නිලධාරීන් බඳවා ගැනීම අඩාල වීම, සිටින නිලධාරීන් ගිණුම් සකස් කිරීම පිළිබඳ දැනුමක් නොවීම , නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගිණුම් ඉදිරිපත් නොවීමට බලපා ඇති බව. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.19.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 46 (1) වගන්තිය ප්‍රකාරව සිදු කර තිබූ පරීක්ෂණවලට අදාළව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැති මහනුවර දිස්ත්‍රික්කයේ සමිති 03 ක රු. 17,113,344 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමිති 02 ක රු. 25,200,707 ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමිති 02 ක රු.43,372,637 ක් ලෙස සමිති 07 කින් අයකර ගත යුතු එකතුව රු. 85,686,687 ක අධිභාර ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | රු. 47,194,931 ක අධිභාර සම්බන්ධයෙන් නැවත නිදහසට කරුණු විමසීම, රු. 16,587,711 ක අධිභාර තීරකකරණයට යොමු කිරීම සහ රු. 21,904,045 ක අධිභාරයට අදාළ අලාභය දක්වා යැවීමට කටයුතු කිරීම වැනි ක්‍රියාමාර්ග ගනිමින් මෙම ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කරමින් පවතින බව. | විධිමත් පරිදි සමිති අධීක්ෂණ කටයුතු සිදු කළ යුතු අතර සමිතිවල ඇති වෙනත් ගැටළු සම්බන්ධයෙන් ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමුපකාර සමිති අතරින් 2025 දෙසැම්බර් 31 දින වන විට අවධානම් සමිති ලෙස හඳුනාගෙන තිබූ මහනුවර දිස්ත්‍රික්කයේ සමිති 03 කින් තැන්පත්කරුවන් 2962 ක් සඳහා රු.158,051,775 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමිති 08 කින් තැන්පත්කරුවන් 40128 ක් සඳහා රු.1,105,372,627 ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් සමිතියකින් තැන්පත්කරුවන් 690 ක් සඳහා රු. 13,593,792 ක්ද ලෙස සමිති 12 කින් තැන්පත්කරුවන් 43780 ක් සඳහා නිරවුල් කිරීමට පවතින තැන්පත් මුදල් වටිනාකම රු.1,277,018,194 ක් වී තිබූ අතර මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ප්‍රමාණවත් නොවුණි. | පිළිගනිමි. මෙම සමිතිවල කළමනාකරණ දුර්වලතා හේතුවෙන් ද්‍රවශීලතාවය දුර්වලවීම මත තැන්පතු නැවත ඉල්ලූ පසු ලබා දීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි. දැනට සමිති විසින් තැන්පත්කරුවන් වෙත මුදල් නිදහස් කිරීමේ සැලැසුම් ඉදිරිපත් කර ඇති බවත්, අධීක්ෂණ නිලධාරීන් මඟින් තැන්පතු ආපසු ගෙවීම් සඳහා උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙන බවත්, මූල්‍ය වංචා හා අවභාවිතයන් සිදු වී ඇති සමිති සම්බන්ධයෙන් අධිභාර කටයුතු සිදු කරන බව. | විධිමත් පරිදි සමිති අධීක්ෂණ කටයුතු සිදු කළ යුතු අතර සමිතිවල ඇති වෙනත් ගැටළු සම්බන්ධයෙන් ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු කළ යුතුය. |

### 1.5.20 මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන අරමුදල

#### 1.5.20.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ XI පරිච්ඡේදයේ (ජ) රීතිය | සමුපකාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට සියළුම ලියාපදිංචි සමිතිවලින් හෝ එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධිවිධාන සැලැස්වීම ද ඒ අරමුදලේ පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීමද සිදු කළ යුතු බව සඳහන් වුවද මෙම අරමුදලේ ගනුදෙනු පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, විගණනය කිරීම ඇතුලු අනෙකුත් පරිපාලන කටයුතු සිදු කිරීම පිළිබඳව ප්‍රඥප්තියක් හෝ රීති මාලාවක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රඥප්තිය සකස් කර ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මේ පිළිබඳව පළාත් සහ නීති අංශය සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | ප්‍රඥප්තියක් සහ රීති මාලාවක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.20.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------------------ | -------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සමූපකාර සංවර්ධන අරමුදලට මහනුවර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 159 කින් රු.119,947,992 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 229 කින් රු.35,293,217 ක් ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 92 කින් රු.47,744,090 ක්ද ලෙස සමිති 480 කින් එකතුව රු.202,985,299 ක හිඟ දායකත්ව මුදල් අය නොවී පැවතුණි. | හිඟ දායක මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ දායක මුදල් නියමිත වේලාවට අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂය තුළ ක්‍රියාකාරී සමූපකාර සමිති 520 ක් අතරින් සමිති 160 ක් පමණක් සමූපකාර සංවර්ධන අරමුදලට දායක මුදල් ලබා දී තිබූ අතර සමිති 360 ක් එනම් සියයට 69 ක් මෙම අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි. ඒ තුළ 2025 වර්ෂයේ ක්‍රියාකාරී නිෂ්පාදන සමිති 22 ක 2025 වර්ෂයට අදාළ දායක මුදල් ගෙවා නොතිබුණි. | වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර මෙතෙක් අය නොවූ ශේෂ උසාවි දඩ මුදලින් ද අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | දායක මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

**1.5.21 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1.5.21.1 හඳුනා ගන්නා ලද පාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | -------------------------------------------- | ------------ |
| මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන යටතේ මහනුවර - නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ රම්බොඩ ප්‍රදේශයේ 2016 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පර්චස් 10 ක බිම් කොටසක රන්ලිය හෙළ බොජුන්හල ඉදිකර තිබූ අතර එහි ආහාර අලෙවි කිරීමේ කටයුතු 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට ආරම්භ කර තිබුණි. නමුත් මෙම බිම් කොටස පෞද්ගලික පාර්ශවයකට අයිති බව පසුව තහවුරු වී තිබුණි. ඒ අනුව ඉඩමේ අයිතිය නිසි පරිදි තහවුරු කර ගැනීමකින් තොරව ඉදිකර තිබූ මෙම හෙළ බොජුන්හල එම ස්ථානයෙන් ඉවත්කර ගැනීමට සිදුවීම හේතුවෙන් එය ඉදිකිරීමට හා නඩත්තුව වෙනුවෙන් දරන ලද රු. 4,354,494 ක මුදලක් රජයට පාඩු වී තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත ඉදිකිරීම් සිදු කර ඇති බවත්, පෞද්ගලික පාර්ශවයක් විසින් 2020 දෙසැම්බර් 24 දිනැති ලිපියක් ඉදිරිපත් කර අයිතිය ප්‍රකාශ කර ඇත. ඉඩම හිමි පෞද්ගලික පාර්ශවය විකල්ප ඉඩමක හෙළ බොජුන්හල ස්ථාපිත කිරීමට යන වියදම දැරීමට එකඟ වී ඇති බව. | ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ඉඩම්වල අයිතිය තහවුරු කර ගත යුතු වන අතර අදාළ වියදමට සරිලන පරිදි වෙනත් ස්ථානයක බොජුන්හළ ඉදිකරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.22 ශීර්ෂය 592 – මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**1.5.22.1 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | -------------------------------------------- | ------------ |
| (අ) | 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 05 ක කාලය තුළ මධ්‍යම පළාතේ සමස්ථ කිරි නිෂ්පාදනය ලීටර් 433,042,034 කින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය ලීටර් 297,367,139 ක් වූ අතර එය මධ්‍යම පළාතේ මුළු කිරි නිෂ්පාදනයෙන් 68% ක් වී තිබුණි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය 17%ක් ද මාතලේ දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය 15% ක් ද විය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය පශු වෛද්‍ය කොට්ඨාශයේ 2023 හා 2024 වර්ෂ වල සමස්ත කිරි නිෂ්පාදනය ලීටර් 38,858,793 ක් වුවද ඉන් ලීටර් 36,078,819 ක් හෙවත් සියයට 93 ක ප්‍රමාණයක් පෞද්ගලික ආයතනයක් වන අඹේවෙල ගොවිපලේ කිරි නිෂ්පාදනය වී තිබුණි. | මහා පරිමාණ ගොවිපල වලට ද සේවා අවශ්‍යතාවය අනුව රජයේ පශු වෛද්‍ය කාර්යාලයේ සේවය ලබාගත හැකි බවත් මධ්‍යම පළාතේ ගොවිපල 98% ක් සුළු පරිමාණ ගොවිපල බව. | මධ්‍යම පළාතේ කිරි නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාතේ 2020 වර්ෂයේ එළගව, මීගව හා එළුවන් ගොවිපල සංඛ්‍යාව 43,334 ක් වූ අතර 2025 වර්ෂය වන විට එය 28,449 ක් දක්වා සියයට 34 කින් අඩු වී තිබුණි. එමෙන්ම 2020 වර්ෂයේ සත්ව ගහණය 171,155 ක් වී තිබුණු අතර 2025 වර්ෂය වන විට එය 147,319 ක් දක්වා සියයට 14 කින් අඩු වී තිබුණි. 2021 වර්ෂයේ කෘතිම සිංචන සේවා, ගැබ් පරීක්ෂණ, උපත් ප්‍රමාණය පිළිවෙලින් 58,445, 29,223 හා 19,482 ක් වූ අතර 2025 වන විට එය පිළිවෙලින් 45,751, 11,527 හා 15,415 ක් වීමෙන් එය පිළිවෙලින් 12,694, 17,696, 4,068 එනම් සියයට 22, සියයට 61 හා සියයට 21 කින් පහල ගොස් තිබුණි. | මුළු ගොවිපල සංඛ්‍යාව අඩු වීම කෙරෙහි ගව හා මීගව ගොවිපල සංඛ්‍යාව අඩුවීම සහ 2020 ,2022 කාලය තුළ රට තුළ පැවති කොරෝනා වසංගතය ,ආර්ථික අර්බුදය හේතු වී ඇති බවත් පශු වෛද්‍ය කාර්යාල වල තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සේවයෙන් ඉවත් වීම කෘතිම සිංචන සේවා අඩු වීමට හේතු වී ඇති බව. | ගොවිපල සංඛ්‍යාව, සත්ත්ව ගහණය සහ දෙපාර්තමේන්තු සපයන සේවා වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.23.2 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ඇතුලත් සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය (EGSD) යටතේ පශු වෛද්‍ය සේවා පුළුල් කිරීමේ අරමුණින් හැටන් පශු වෛද්‍ය කාර්යාලයට රු.4,152,631ක් වැය කර වර්ග අඩි 787.44 ක රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදි කර රසායනාගාර උපකරණ ලබා දී තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකර වසර 4ක කාලයක් ගත වී තිබුණද රසායනාගාර සේවා පවත්වා නොතිබුණු අතර එහි කිරි හා ගොම ආශ්‍රිත රසායනික පරීක්ෂණ පැවැත්වීම සඳහා 2020 අගෝස්තු 18 වන දින ලබා දී තිබූ රසායනාගාර උපකරණ 24 න් 16 ක් සමාලෝචිත වර්යේ අවසානයටද භාවිතයට ගෙන නොතිබුණි. | ගොඩනැගිලි හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අදාළ ව්‍යාපෘති වලින් අපේක්ෂිත වූ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.23 ශීර්ෂය 593 – මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**1.5.23.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2017 අංක 05 දරන මධ්‍යම පළාත් වාරිමාර්ග ප්‍රඥප්තියේ II කොටසේ 7(5) වගන්තිය | පළාත් අධ්‍යක්ෂවරයා විසින්ම පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්වන සියලුම වාරික්‍රමවල ලැයිස්තුවක් සකස් කර රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදියර වශයෙන් වාරික්‍රම ගැසට් පත්‍රයේ පළ කිරීමට අදහස් කර ඇති බවත් ඒ අනුව තෝරා ගත් ගොවිජන සංවර්ධන කොට්ඨාශ වල ස්ථාන පරීක්ෂාවන් සිදු කර ආකෘති පත්‍ර ලැබුණු පසු ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරන බව. | වාරිමාර්ග ප්‍රඥප්තියේ විධි විධාන ප්‍රකාරව වාරික්‍රමවල ලැයිස්තුවක් සකස් කර රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |